දැරණියගල ප්‍රාදේශීය සභාව - 2022

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)  (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දියර ඉසින යන්ත්‍ර 05ක, හැමර් යන්ත්‍රයක, දම්වැල් කියතක සහ රු.800,000ක් වූ බ්‍රේලර් යන්ත්‍රයක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වේ. 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ඉදිකිරීමට අපේක්ෂා කළ ද, ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවූ කඩකාමර 20 ක් වෙනුවෙන් ලබාගත් පෙර ගෙවුම් (Key money) මුදල් රු.22,080,000 ක් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු ලෙස ඉදිරියට ගෙන එමින් තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | මාසික කුලියට ලබා දී ඇති සතිපොළ කඩකාමර 4ක් සඳහා ලැබිය යුතු රු.1,728,000ක පෙර ගෙවුම් ශේෂයක් ඉදිරියට ගෙන එමින් තිබුණි. | - එම - | - එම - |

#### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 03ක පැවැති ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛනවල එදිනට පැවැති ශේෂ හා සැසඳීමේදී රු.4,024,127ක වෙනසක් පැවැතිණි. | එකඟ වේ. දීර්ඝ කාලයක සිට පවතින මෙම ශේෂ, ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු ගැලපීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතු වේ. |

#### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල හා පුස්තකාල උපකරණ රු.7,261,856ක නිවැරදිතාව තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛන ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. 2023 ගිණුම් සමග එම උපලේඛන ඉදිරිපත් කරන බව | අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

#### 1.6.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.245,025ක භාණ්ඩ ඌනතාවක් වගකිවයුතු අයගෙන් අයකිරීමට ඇති හැකියාව සොයා බැලීමකින් තොරව හා නිසි අනුමැතියක් ද රහිතව කපා හැර තිබුණි. | එකඟ වන බව. | අදාළ ඌනතා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහජන නියෝජිතයින් වෙත ආපසු අයකිරීමේ පදනම මත සහා අරමුදලින් ණය මුදල් ලබාදීමට කිසිදු ආකාරයක හෝ නෛතික ප්‍රතිපාදන නොතිබියදී, 2022 වර්ෂය තුළ සභිකයින් 10 දෙනකුට රු.200,000ක උත්සව අත්තිකාරම් ලබා දී වාරික වශයෙන් අයකර තිබුණි. | එකඟ වේ. මහ සභාවේ අනුමැතිය ලැබිණි. එම මුදල් 2022 වර්ෂයේ දී අයකර ඇත. ඉදිරියේදී, ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන බව | අදාළ වන නිති රිතී අනුව කටයුතු කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| i. මු.රෙ.571 | කල් ඉකුත් වූ රු.345,087ක තැන්පතු 19ක් නියාදනය කර නොතිබුණි. | එකඟ වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,805,812ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,590,670 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,223,845 | 9,169,126 | 8,665,439 | 2,421,200 | 8,217,845 | 8,531,487 | 8,212,571 | 2,281,894 |
| කුලී | 7,246,849 | 8,152,080 | 8,281,477 | 63,684 | 7,688,150 | 5,224,907 | 4,543,865 | 783,296 |
| බලපත්‍ර ගාස්තු | 790,100 | 1,264,476 | 1,305,476 | 9,100 | 790,100 | 907,152 | 936,652 | 38,100 |
| වෙනත් ආදායම් | 2,553,500 | 5,007,633 | 4,856,840 | 711,166 | 2,585,500 | 3,578,661 | 3,587,847 | 631,824 |
| එකතුව | **18,814,294** | **23,593,315** | **23,109,232** | **3,205,150** | **19,281,595** | **18,242,207** | **17,280,935** | **3,735,114** |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් හා අක්කර බදු යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.910,041ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.255,489ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.319,094ක ශේෂයක් ද පැවැතිණි. | එකඟ වන බව. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයට වඩා පැරැණි රු.357,869 ක් වූ ලැබිය යුතු රජයේ ආධාර ශේෂය නිරවුල්කර නොතිබුණි. | එකඟ වන බව. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,596,720 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වසර 01ත් වසර 05ත් අතර රු.27,966,021 ක ශේෂ ද , වසර 5 ට වැඩි රු. 24,299,000 ක ශේෂ ද පැවැතිණි. | - එම - | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 03/2010 දරන චක්‍රලේඛයේ 1.3 ඡේදය පරිදි අනවසර ඉදිකිරීම් පාලනයට කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. එමෙන්ම, නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගත්තිය ප්‍රකාරව අනවසර ඉදි කිරීම්වලට එරෙහිව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම වෙනුවට ලැබෙන පැමිණිලි මත නියෝග නිකුත් කර තිබුණි. ඒ සම්බන්ධ පසුවිපරමක් ද නොවුණි. | එකඟ වේ. ඉදිරියේදී ක්ෂේත්‍ර පරීක්ෂණ හා පසු විපරම් සිදු කිරීමට කටයුතු කරන බව | අනවසර ඉදිකිරීම් වැළැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | බස්නැවතුම්පළ කඩකාමර ඉදිකිරීම සඳහා 2014 හා 2015 වර්ෂ තුළ දී ටෙන්ඩර්කරුවන් 29 දෙනෙකුගෙන් අයකරගත් පෙර ගෙවුම් මුදල් රු.24,299,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අදාළ කාර්යයට යොදවාගෙන නොතිබුණු අතර එම මුදල් 2014 වර්ෂයේදීම පරිපූරක ඇස්තමේන්තුවක් මගින් වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි. | එකඟ වන බව. 2014 වර්ෂයේ අයකළ එම මුදල පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් කර්මාන්ත සඳහා වැය දරා ඇති බව | පෙර ගෙවුම් මුදල් අදාළ කාර්යයට යොදවා ගත යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | --------------- |
| (අ) | 59ක් වූ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 27ක් හා 05 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. එම පුරප්පාඩු සඳහා සේවා ගිවිසුම් මත හා අනියම් පදනමින් සේවකයින් බඳවා ගෙන තිබුණි. | එකඟ වේ. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්තය ඵලදායී ලෙස අනුයුක්ත කළ යුතු වේ. |
| (ආ) | අනුමත තනතුරට අතිරික්තව හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව, 2018 ජනවාරි 01 දින සිට සේවා ගිවිසුමක් මත පෙර පාසල් පාලිකාවක් පත්කර එදින සිට 2022 දෙසැම්බර් දක්වා රු.540,000ක් ගෙවා තිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලවකටයුතු කළ යුතු වේ. |
| (ඇ) | වසර 01 සිට වසර 29 දක්වා කාලයක් ගත වී තිබුණු නිළධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.416,699ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකර නොතිබුණි. | එකඟ වේ. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකළ යුතු වේ. |